# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.26 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1945/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. ටී 56 ජීව පතරොම් සොයාගැනීම - මැදවච්චිය පොලිස් ස්ථානය.**

2025.10.25 වන දින දහවල් කාලයේ මැදවච්චිය පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව මැදවච්චිය පොලිස් වසමේ වහමල්ගොල්ලෑව ප්‍රදේශයෙන් ගලා බසින කනදරා ඔයෙහි තිබී **ටී 56 වර්ගයේ ජීව පතරොම් 41 ක් හා පතොරොම් ගැබ් 02 ක් සොයාගෙන** ඇත.

මෙම පතොරොම් එම ස්ථානයට ගෙනවිත් දමන ලද පුද්ගලයින් කවුරුන්ද යන්න අනාවරණය කර ගැනීම සඳහා මැදවච්චිව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෘත ශරීරයක කොටසක් හමුවීම - කාත්තන්කුඩි පොලිස් වසම.**

2025.10.25 වන දින සවස් කාලයේ කාත්තන්කුඩි 05 ප්‍රදේශයේ කලපුවේ මළ සිරුරක හිස කොටස පාවෙමින් ඇති බවට ලද තොරතුරක් මත කාත්තන්කුඩි පොලිස් ස්ථානය මගින් විමර්ශන ආරම්භ කර ඇත.

මෙම හිස කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ වයස අවුරුදු 66 ක පුද්ගලයකුගේ බව හඳුනාගෙන ඇති අතර එම පුද්ගලයා මීට දින දෙකකට පෙර අතුරුදන් වූ බවට කාත්තන්කුඩි පොලිස් ස්ථානය වෙත ඔහුගේ ඥාතීන් විසින් පැමිණිල්ලක් ද ඉදිරිපත් කර තිබූ බවට අනාවරණය වී ඇත.

මෘත ශරීර කොටස හමුවූ ස්ථානය අවට කිඹුලන් බහුලව ගැවසෙන අතර මෙම පුද්ගලයා එම ස්ථානයේ දියනෑමට ගොස් ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර, එහිදී අදාල පුද්ගලයා කිඹුල් ප්‍රහාරයකට ලක්වන්නට ඇති බවට දැනට පොලිසිය සැකකරනු ලබයි. මෘත ශරීර කොටස පශ්වාත් මරණ පරීක්ෂණය සඳහා කාත්තන්කුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - වැලිකන්ද පොලිස් වසම.

2025.10.25 වන දින රාත්‍රී කාලයේ වැලිකන්ද පොලිස් වසමේ වැලිකන්ද කටුවන්විල මාර්ගයේ ඇතුගල ප්‍රදේශයේදී කටුවන්විල දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගයෙන් ඉවතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ වෑන් රථ රියදුරු වැලිකන්ද රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ කටුවන්විල, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**